ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

තනතුරු පුරප්පාඩු - දකුණු මණ්ඩපය

01. විශ්වවිද්‍යාල වෛද්‍ය නිළධාරී

වැටුප් පරිමාණය :
U-MO 1-(II) රු. 43,972 - 10 x 1002 : 1 x 1228 - 55,220 (මාසික)

අවම සුදුසුකම් :

01. අයදුම්කරු පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් එම්.බී.බී.එස්. උපාධිය සමඟ වෛද්‍ය වෘත්තිකයෙකු වශයෙන් වසර 03ට නොඅඩු සේවා කාලයක් සපුරා තිබිය යුතු වේ.

02. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

02. කාර්මික නිළධාරී III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-MT 1-(III A) රු. 25,589 - 7 x 242 : 10 x 287 - 30,153 (මාසික)

අවම සුදුසුකම් :

01. අයදුම්කරු අ.පො.ස (සා.පෙ) විභාගය විද්‍යාව හා ගණිතය යන විෂයන්ද ඇතුළුව සම්මාන සාමාර්ථ 05ක් සහිතව විෂයන් 06 ක් එක් වරකදී සමත්වීම.

02. අ.පො.ස (උ.පෙ) විභාගය ගණිත අංශයෙන් එක් වරකදී සියළුම විෂයන් සමත්වීම (පොදු පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය හැර)

03. තොරතුරු තාක්ෂණය (IT) හා ජාතික තාක්ෂණික සහතිකපත් (NCT - Civil) පාඨමාලාවන් හිමිකරු ඇති අය සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

04. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

03. කළමණාකරණ සහකාර III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-MN 1-(III A) රු. 24,863 - 17 x 242 - 28,977 (මාසික)

අවම සුදුසුකම් :
Category (A)

01. අයදුම්කරු අ.පො.ස (සා.පෙ) විභාගය සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය හා ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් එක් වරකදී සමත්වීම.

සහ

02. අ.පො.ස (උ.පෙ) විභාගය එක් වරකදී සියළුම විෂයන් සමත්වීම (පොදු පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය හැර)
(පැරණි විෂය නිර්දේශය අනුව එකවර විශයන් 03ක් සමත් වීම උවද මෙම කාරණය සඳහා සැහේ)

03. පහත කරුණු සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත:

(a) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි පුහුණුවක් ලබා තිබීම.

සහ

(b) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද.

04. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

05. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

Category (B)

01. අයදුම්කරු අ.පො.ස (සා.පෙ) විභාගය අවම වශයෙන් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

සහ

02. U-PL වැටුප් සංකේතයෙන් දැක්වෙන ප්‍රාථමික මට්ටමේ ස්ථිර තනතුරක් දැරීම හා එම ප්‍රාථමික මට්ටමේ (U-PL) ස්ථිර විය යුතුය.

සහ

03. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දින වන විට ප්‍රාථමික මට්ටමේ තනතුරක වසර 05ක සතුටුදායක අඛණ්ඩ සේවාකාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

04. පොත් තබන්නා II ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-MN 1-(III A) රු. 43,972 - 10 x 1002 : 1 x 1228 - 55,220 (මාසික)

අවම සුදුසුකම් :

01. a) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් විය යුතුය. සම්මාන සාමාර්ථලත් විෂයන් අතරට සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය සහ අංක ගණිතය/ගණිතය යන විෂයන් ඇතුලත් විය යුතුය.
එකවරකදී උසස්පෙළ විශයන් 03ක් සමත්වී තිබිය යුතුය.

සහ

b) **Either**

02. a) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ කම්කරු හා වෘත්තිය පුහුණු කිරීමේ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයකින් හෝ බහු තාක්ෂණික ආයතනයකින් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකයක් ලබා තිබීම.

හෝ

b) උසස් අධ්‍යාපන ආයතනයක/සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක පොත් තබන්නෙකු ලෙස වසර 05 ක අත්දැකීමක් තිබීම.

03. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. 08 ශ්‍රේණිය සමත් විය යුතුය.

02. 1/32, පරිමාණ කියවීමට හැකි වීම, භාග මිනුම් සටහන් කර ගත හැකි වීම, තෙල් පෙරණ (Oil Filter) ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව ඇතුළත්ව එන්ජින් සහ පොම්ප වල එදිනෙදා වෙනස් කිරීම් සහ එදිනෙදා නඩත්තු කල හැකි වීම.

03. ස්පර්ශක ආමාන (Feeler gauges) ක්‍රියාකරවීම, ස්ථාවර තෙරපුම් උෂ්ණත්ව මානයන් කියවීමට සහ තේරුම් ගැනීමට හැකි විය යුතුය.

04. පොම්ප සහ එන්ජින් වල කොටස් අළුත්වැඩියා කටයුතු කිරීම මෙන්ම නිසි පරිදි ස්ථාපනය කල හැකි වීම සහ අනෙකුත් සුළු අළුත්වැඩියා කටයුතු ඉටු කල හැකි විය යුතුය.

05. විදුලි ජනක යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳ ප්‍රවීණතාවයක් තිබිය යුතු අතර ප්‍රධාන විද්‍යුත් විභාජන (Electrical Main Distribution) සම්බන්ධ ගියර් පද්ධති හැසිරවීම සම්බන්ධයෙන් පළපුරුද්දක් තිබිය යුතුය.

06. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරුවෙකු වශයෙන් පලපුරුද්දක් ලබා ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

07. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසන් දිනය
2018.10.20

06. වායු සමීකරණ කාර්මික III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 3-(III) රු. 24,209 - 16 x 218 - 27,697 (මාසික)

අවම සුදුසුකම් :

01. සිංහල/ දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකියාව.

02. සියලුම වර්ගයේ වායුසමීකරණ යන්ත්‍ර ක්‍රියාකරවීමට සහ ඒවායේ ඇතිවිය හැකි දෝෂ හඳුනාගැනීම, අළුත්වැඩියා කිරීම සහ ට්‍රාන්ස්පෝමර් ඇතුළු සියළුම යන්ත්‍ර කොටස් එකලස් කිරීමට හැකිවීම.

03. ඇඳීම් සහ රූප සටහන් කියවීම සහ කියවා තේරුම් ගැනීම, මිනුම් කියවීම සහ අසම්පූර්ණ මිනුම් සටහන් කිරීමට හැකිවීම.

04. රජයේ දෙපාර්තමේන්තුවක රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක වායු සමීකරණ කාර්මිකයෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම.

05. විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් ආයතනයකින් වෘත්තියට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ සහතිකපත් පාඨමාලාවක් හදාරා ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

06. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

07. රසායනාගාර සහයක III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. 08 ශ්‍රේණිය සමත් විය යුතුය.

02. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

03. රසායනාගාර උපකරණ මෙවලම් භාවිතය සහ සාමාන්‍ය භාවිතයට ගනු ලබන රසායනික ද්‍රව්‍ය පිළිබඳ දැනුමක් ඇති සහ පිළිගත් ආයතනයකින් තාක්ෂණික/වෘත්තිමය පාඨමාලා හදාරා ඇති අයට සහ පරිගණක භාවිතය හා පරිගණක සම්බන්ධ දැනුමක් ඇති සහ පිළිගත් ආයතනයකින් ඒ පිළිබඳව පාඨමාලාවක් හදාරා ඇති අයට ප්‍රමුඛතාවය හිමිවනු ඇත.

04. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

08. විදුලි කාර්මික III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

02. ට්‍රාන්ස්පෝමර්, සියලුම වර්ගයේ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වල වැරදි හඳුනාගෙන ඒවා අලුත්වැඩියා කිරීම සහ අමුද්‍රව්‍ය එකලස් කිරීම, විවිධ වර්ගයේ රැහැන් හා ඒවායේ වර්ග කිරීම්, මානක උපකරණ හා ඒවායේ භාවිතයන්, විවිධ වර්ගයේ විදුලි රැහැන් ඇඳීම, මාපක සම්බන්ධ කිරීම, මාපක සහ කුඩා ප්‍රමාණයේ ට්‍රාන්ස්පෝමර් පරීක්ෂා කිරීමට හැකියාව තිබීම.

03. සටහන්, රූප සටහන් කියවීම සහ කියවා තේරුම් ගැනීම, මිනුම් කියවීම හා අසම්පූර්ණ මිනුම් සටහන් කිරීමට හැකියාව තිබීම.

04. වෘත්තියට අදාල මෙවලම් උපකරණ භාවිතය හා පාලනය කිරීමට හැකි වීම.

05. විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් ආයතනයකින් වෘත්තියට අදාල ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ සහතිකපත් පාඨමාලාවක් හදාරා තිබීම.

06. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා ඇති අයට ප්‍රමුඛතාව හිමිවේ.

07. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

09. ජලනල කාර්මික III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

02. 1/64" පරිමාණ කියවීමේ හැකියාව සහ දැනට භාවිතා වන උපකරණ නඩත්තු කිරීමේ හැකියාව.

03. G.I. සහ C.I. පයිප්ප එළීමේ හැකියාව සහ ඒවා සම්බන්ධ කිරීම/ පරීක්ෂා කිරීම පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

04. බෝල්වෑල්ව්/ ජලටැංකි අළුත්වැඩියාව සහ සවිකිරීම පිළිබඳව හා සරළ රූප සටහන් ඇඳීම පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු වීම.

05. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක ජලනල කාර්මිකයෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පලපුරුද්දක් ලබා ඇති අයට ප්‍රමුඛතාව හිමිවේ.

06. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

10. පෙදරේරු III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

02. ගඩොල් ආශ්‍රිතව බැම් බැඳීම, අත්තිවාරම් දැමීම, බිත්ති බැඳීම, කුළුණු බැඳීම, දුම් කවුළු සැකසීම, කාණු පද්ධති සැකසීම ආදියට ඇති හැකියාව.

03. කපරාරු කිරීම, කොන්ක්‍රීට් මිශ්‍රණ සැකසීම, කොන්ක්‍රීට් ඇතිරීම හා කොන්ක්‍රීට් ආශ්‍රිත සියළු ක්‍රියාකාරකම් වලට ඇති හැකියාව.

04. ගොඩනැගිලි ඉදිකිරීම් වලට අදාළ සැලසුම් කියවීමට හා සාමාන්‍ය ඉදිකිරීම් වලට අදාල අත්තිවාරම් සැලසුම් කිරීමට ඇති හැකියාව.

05. වර්ණ ආලේප කිරීමට ඇති හැකියාව.

06. පෙදරේරුවෙකු වශයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

07. විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් ආයතනයකින් වෘත්තියට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ සහතිකපත් පාඨමාලාවක් හදාරා ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

08. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

11. වඩු කාර්මික III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

02. වඩු කර්මාන්තය ආශ්‍රිතව ගොඩනැගිලි ඉදිකිරීමේදී හා දවමය නිෂ්පාදන කිරීමේදී සිදුකරනු ලබන වැද්දීම් කිරීම හා ඒවා සැලසුම් කිරීම පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු වීම.

03. වෘත්තියට අදාළ මෙවලම්, උපකරණ භාවිතය හා පාලනය කිරීමට හැකිවීම.

04. විවිධ දැව වර්ග හඳුනා ගැනීම සහ ඇඳීම් කියවීමට හැකිවීම.

05. අඟල 1/32 දක්වා නිවැරදිව කියවීමට හැකිවීම.

06. වඩු කාර්මිකයෙකු වශයෙන් වසර 02කට නොඅඩු පළපුරුද්ද

07. විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් ආයතනයකින් වෘත්තියට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ සහතිකපත් පාඨමාලාවක් හදාරා ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

08. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න www.kdu.ac.lk

12. අරක්කැමි (පහල ශ්‍රේණිය)

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. 08 ශ්‍රේණිය සමත් විය යුතුය.

02. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

03. පෙරදිග හා අපරදිග ආහාර වර්ග පිසීම පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

04. විවිධ කෑම වර්ග පිළියෙල කිරීමට අවශ්‍ය කුළුබඩු හා වෙනත් ද්‍රව්‍ය පිළිබඳව දැනීමක් සහ දක්වන ලද නියමිත සංඛ්‍යාවක් සඳහා එක් එක් ආහාර වට්ටෝරු පිළියෙල කිරීමේදී යොදාගත යුතු කුළුබඩු සහ වෙනත් ද්‍රව්‍ය නියමිත ප්‍රමාණයන් පිළිබඳවද මනා දැනීමක් තිබිය යුතුය.

05. එකවර 50 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකට ආහාර පිළියෙළ කිරීමට හැකියාව තිබිය යුතුය.

06. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(විදුලි උදුන් සහ ගෑස් උදුන් පරිහරණය පිළිබඳ දැනුමක් ඇති අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ)

13. බීමහල් සේවක III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. 08 ශ්‍රේණිය සමත් විය යුතුය.

02. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

03. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක බීමහල් සේවකයෙකු වශයෙන් සේවය කර ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

04. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

14. පුස්තකාල සහායක III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 2-(III) රු. 22,683 - 16 x 218 - 26,171 (මාසික)

අවම සුදුසුකම් :

01. අ.පො.ස. සා.පෙළ. සිංහල/දෙමළ/ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළත්ව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබිය යුතුය.

03. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පුස්තකාල සහයකයෙකු වශයෙන් පලපුරුද්දක් ලබා ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

04. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

15. සනීපාරක්ෂක කම්කරු III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 1-(III) රු. 21,875 - 15 x 202 - 24,905 (මාසික)

අවම සුදුසුකම් :

01. 08 ශ්‍රේණිය සමත් විය යුතුය.

02. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

03. වැසිකිළි, නානකාමර සහ කාණු පද්ධති පිරිසිදු කිරීමට හැකියාව තිබිය යුතුය

04. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - රත්මලාන

16. සුපරීක්ෂක (භූමි දර්ශක)

වැටුප් පරිමාණය :
U-MT 1-(III A) රු. 25,589 - 7 x 242 : 10 x 287 - 30,153 (මාසික)

අවම සුදුසුකම් :

01. අ.පො.ස (සා.පෙ) විභාගය විෂයන් 06 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

සහ

02. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ වෙනත් පිළිගත් ආයතනයක් විසින් පවත්වන ලද කෘෂිකර්මය සම්බන්ධ එක් අවුරුදු ප්‍රායෝගික පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

03. වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

17. කම්කරු III ශ්‍රේණිය

වැටුප් පරිමාණය :
U-PL 1-(III) රු. 21,875 - 15 x 202 - 24,905 (මාසික)

අවම සුදුසුකම් :

01. 08 ශ්‍රේණිය සමත් විය යුතුය.

02. සිංහල/දෙමළ භාෂාව කියවීමට හා ලිවීමට හැකිවීම.

03. උද්යෝගිමත්, නම්‍යශීලී කණ්ඩායමක් සමග එකට වැඩ කළ හැකි වීම හා මනා සන්නිවේදන හැකියාවෙන් යුක්ත වීම.

04. ටයර් මාරු කිරීම, පැච් දැමීම සහ ඒ හා සම්බන්ධ කටයුතු ඉටු කිරීමට හැකියාව ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

05. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. තෝරා ගැනීම් සිදු කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ඒ ඒ තනතුරු වලට අදාලව අනුමත කරන ලද බඳවා ගැනීම් සහ උසස් කිරීම් පටිපාටීන්ට අනුකූලව ලිඛිත/ප්‍රායෝගික සහ/හෝ සම්මුඛ පරීක්ෂණ වල ප්‍රතිඵල මතය.

03. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය මඟින් ඒ ඒ තනතුරු/ශ්‍රේණි සඳහා අනුමත කරන ලද පුරප්පාඩු සංඛ්‍යාව ඇතුලත පමණක් තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

04. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

05. අයදුම්කරුවන් වෙබ් අඩවියෙන් භාගත කරන ගන්නා ලද අයදුම්පත් 2018 ඔක්තෝම්බර් මස 20 වන දින හෝ එයට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

06. ඌව, සබරගමුව හා දකුණු පළාත් වල පදිංචි කරුවන් සඳහා දක්ෂිණ මණ්ඩපයෙහි තනතුරු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

අයදුම්පත් එවිය යුතු ලිපිනය

ලේඛකාධිකාරී
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල
ආරක්ෂක විශ්වවිද්‍යාලය
රත්මලාන